රුහුණ විශ්වවිද්‍යාලය

**2016/2017 ශාස්ත්‍රවේදී (සාමාන්‍ය/විශේෂ) උපාධි 2000 ස්ථලය**

**පළමු සමාසික පරීක්ෂණය - 2017 ඔක්තෝබර්/නොවැම්බර්**

**SLS 21523/21623 - නූතන සිංහල පද්‍ය සාහිත්‍යය**

ප්‍රශ්න <u>පහකට (05)</u> පමණක් පිළිතුරු සපයන්න.

**කාලය : පැය 03 යි.**

---

01. කොළඹ කවියට පූර්ව වකවානුවෙහි ප්‍රචලිත ව පැවති කාව්‍ය නිර්මාණ සිංහල කාව්‍යයෙහි විකාසනය කෙරෙහි කවර අන්දමින් බලපෑවේ ද යන වග නිදසුන් දෙමින් පැහැදිලි කරන්න.

02. ළමා පද්‍ය විෂයයෙහි අනුකාරක ශබ්දවල උපයෝගිතාව කුමාරතුංග මුනිදාසගේ නිර්මාණ ඇසුරෙන් විශද කරන්න.

03. "කොළඹ කවියේ ප්‍රථම තරංගයට අයත් කවීන්ගේ නිර්මාණ අසාර්ථක වූයේ සංස්කෘත කවිසමයත්, ඉපැරණි අර්ථාලංකාරත් අවිචාරයෙන් භාවිත කළ බැවිනි." මෙහි සත්‍යාසත්‍යතාව විමසන්න.

04. වස්තු විෂය, භාෂා භාවිතය, හා කාව්‍යෝපක්‍රම යෝජනයෙන් නවතාවක් ප්‍රකට කිරීම කොළඹ කවියේ ද්විතීය තරංගය නියෝජනය කරන කවීන්ගේ මුඛ්‍යාභිප්‍රාය වූ බව අදාළ පද්‍ය නිර්මාණ තුනක් ඇසුරෙන් පැහැදිලි කරන්න.

05. නිදහස් කවියේ ප්‍රථම තරංගයට අයත් කවීන් තිදෙනෙකුගේ නිර්මාණ ආශ්‍රයෙන් තත් කාව්‍ය ප්‍රවණතාවෙහි අනන්‍යතා ලක්ෂණ භාෂා රීතිය, ආකෘතිය සහ වස්තු විෂය යන කරුණු පාදක කොට ගෙන විමසන්න.

06. නිදහස් කවියේ ද්විතීය තරංගය තත් කාව්‍ය ප්‍රවණතාවෙහි ප්‍රථම තරංගයෙන් වෙනස් වන්නේ කවර ලක්ෂණ මුල් කොට ගෙන දැයි සනිදර්ශන ව පැහැදිලි කරන්න.

07. කවිය යනු භාෂාව මූලික කරගත් නිර්මාණ භාවිතයක් වුව ද කාව්‍යමය වාග් ව්‍යවහාරය සම්බන්ධයෙන් කවීන් දක්වන අවධානය ඔබට අභිමත නූතන කවීන් තිදෙනෙකුගේ නිර්මාණ ඇසුරෙන් විමසුමට ලක් කරන්න.

08. පරාක්‍රම කොඩිතුවක්කුගේ කාව්‍ය නිර්මාණවල දැකිය හැකි විශේෂතා පිළිබඳ සංක්ෂිප්ත විවරණයක් කරන්න.

සෑම පිළිතුරකට ම ලකුණු 12 බැගිනි.

55

@@@@@@@@